*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

**6 ශ්‍රේණිය** # බුද්ධ ධර්මය **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් 40 ක් හිමිවේ.

---

## I - කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 සිදුහත් කුමාරයාගේ පියා වූයේ,

(1) සුද්ධෝදන රජතුමා ය. (2) අංජන රජතුමා ය.
(3) සුප්‍රබුද්ධ රජතුමා ය. (4) බිම්බිසාර රජතුමා ය.

02 බෝසත් කුමරුගේ නම් තැබීමේ මංගල්‍යයට කැඳවූ බමුණු පඬිවරු ගණන,

(1) 5 කි. (2) 7 කි. (3) 8 කි. (4) 108 කි.

03 මහාමායා දේවියගේ මව්පියන් ජීවත් වූයේ,

(1) රජගහ නුවර ය. (2) කිඹුල්වත් නුවර ය.
(3) දෙව්දහ නුවර ය. (4) සැවැත් නුවර ය.

04 බෝසතාණන් වහන්සේ ''ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස'' යනුවෙන් ප්‍රකාශ කළේ,

(1) ''මම ලොවට අග්‍ර වෙමි යන්නයි.''
(2) ''මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි යන්නයි.''
(3) ''මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි යන්නයි.''
(4) ''නැවත මාගේ උපතක් නොවේ යන්නයි.''

05 නම් තැබීමේ උළෙල පැවැත්වූයේ සිදුහත් කුමරු ඉපදී දින කීයකට පසුව ද?

(1) පහකට පසුව (2) හතකට පසුව
(3) හතරකට පසුව (4) අටකට පසුව

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල (අ) කොටසේ වචන හා සම්බන්ධ වන (ආ) කොටසේ වචනය තෝරා ඉරකින් යා කරන්න.**

| | (අ) | | (ආ) |
|---|---|---|---|
| 06 | නිරෝගී බව | 1. | වුද්ධානුමතං |
| 07 | සිල්වත් බව | 2. | සුතං |
| 08 | වැඩිහිටි උපදෙස් ලැබීම | 3. | සීලං |
| 09 | හොඳ ඉගෙනීමක් තිබීම | 4. | ධම්මානුවත්තී |
| 10 | දැහැමිව ජීවත් වීම | 5. | ආරෝග්‍ය |

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.**

11 බිම්බිසාර රජතුමාට බෝසතාණන් වහන්සේ හමුවූයේ පාණ්ඩව පර්වතය පාමුලදී ය. ( )

12 බෝසතාණන් වහන්සේගේ දැඩි අධිෂ්ඨානය හා නොසැලෙන වීර්යය දුෂ්කර ක්‍රියාවෙන් පැහැදිලි වේ. ( )

13 විහාරස්ථානයට ගියවිට දෙවනුව වන්දනා කරන්නේ ශාරීරික චෛත්‍යයට ය. ( )

14 මෛත්‍රී භාවනාව වඩන්නා මරණින් මතු බඹලොව උපත ලබයි. ( )

15 තමා උපමාවට ගෙන අනුන්ට හිංසා පීඩා නොකිරීම ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය නම් වේ. ( )

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(ඝටීකාර බ්‍රහ්මයා / සහම්පතී බ්‍රහ්මයා / කීර්තිය පැතිරීම / බොරු කීමෙන් වැළකීම / ප්‍රාණීන් මැරීමෙන් වැළකීම)

16 ගිහි ගෙයින් නික්ම ගිය සිදුහත් කුමාරයාට පැවිදි වීමට අවශ්‍ය සිවුරු පිරිකර පූජා කළේ ........................................................................ ය.

17 තුසිත දෙව්ලොව වැඩසිටි බෝසත් දිව්‍ය පුත්‍රයාට මිනිස් ලොව උපදින ලෙස .................................................. ඇතුළු දෙව්වරු ආරාධනා කළහ.

18 ........................................................................................ සම්මා කම්මන්තයට අයත් මාර්ග අංගයකි.

19 ........................................................................................ සම්මා වාචාවලට අයත් මාර්ග අංගයකි.

20 ........................................................................................ සිල්වත්ව ජීවත්වීමෙන් ලැබෙන ආනිසංසයකි.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (i) බෝසත් කුමරුගේ උපතත් සමග සිදුවූ අසිරිමත් සිදුවීම් දෙකක් ලියන්න.

(ii) පස් මහ බැලුම් වලින් දෙකක් නම් කරන්න.

(iii) ''එත්තාවතා ච අම්හේහි'' යන ගාථාව භාවිත කරන්නේ කුමක් සඳහා ද?

(iv) රාහුල තෙරුන් වහන්සේට ලැබුණු අගතනතුර කුමක් ද?

(v) ''මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යන්නෙහි තේරුම කුමක් ද?

(vi) දරුවන්ගෙන් මව්පියන්ට ඉටුවියයුතු යුතුකම් දෙකක් ලියන්න.

(vii) ජාතික කොඩිය පරිහරණයේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.

(viii) ''අත්තුපනායික ධර්ම පරියාය'' යනු කුමක් ද?

(ix) පරිසරය දූෂණය වීමෙන් අපට ඇතිවන ගැටලු දෙකක් නම් කරන්න.

(x) දේවානම් පියතිස්ස රජතුමා

1. මිහිඳු හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලාට ඉදිකොට පූජා කළ ආරාමය කුමක් ද?

2. සංඝමිත්තා තෙරණිය ඇතුළු භික්ෂුණීන් වහන්සේලාට ඉදිකොට පූජා කළ ආරාමය කුමක් ද?

(ලකුණු 2 x 10 = 20)

02 (i) සිදුහත් තාපසතුමාගේ ගුරුවරුන් තිදෙනාගෙන් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) බෝසතාණන් වහන්සේ උපදවා ගත් ත්‍රිවිද්‍යා නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) බෝසතාණන් වහන්සේගේ චරිතයෙන් අපට ගතහැකි ආදර්ශ මොනවාදැයි කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 05 යි.)

03 (i) සීලය යනු කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) ත්‍රිශික්ෂාවෙහි සීල ශික්ෂාවට අයත් අංග තුන නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) සිල්වත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ආනිසංස පහ ලියන්න. (ලකුණු 05 යි.)

04 (i) මිහිඳු මහ රහතන් වහන්සේ සමඟ පැමිණි රහතන් වහන්සේලා දෙදෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) දේවානම් පියතිස්ස රජතුමා ඉදිකළ වෙහෙර විහාර තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු ධර්මදූත පිරිස අපේ රටට වැඩමවීම නිසා අපට ලැබුණු දායාද පහක් නම් කරන්න. (ලකුණු 05 යි.)

05 (i) සම්පත් ආරක්ෂා කිරීම ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) එම සූත්‍රයේ සඳහන් වන සම්පත් ආරක්ෂා කර ගැනිමට අදාළ උපදෙස් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) පාසලේ තිබෙන සම්පත් අරපිරිමැස්මෙන් පාවිච්චි කිරිමට ඔබට ගතහැකි ක්‍රියාමාර්ග පහක් නම් කරන්න. (ලකුණු 05 යි.)

06 (i) ''දස්සනකාමෝ සීලවතං - සද්ධම්මං සෝතුමිච්ඡති'' යන ගාථාවේ ඉතිරි පද දෙක ලියා දක්වන්න. (ලකුණු 02 යි.)

(ii) ශ්‍රද්ධාවන්තයෙකු තුළ දැකිය හැකි ලක්ෂණ තුන ලියන්න. (ලකුණු 03 යි.)

(iii) අමූලික ශ්‍රද්ධාව හා ආකාරවතී ශ්‍රද්ධාව වෙන වෙනම හඳුන්වන්න. (ලකුණු 05 යි.)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 1 (02) 4 (03) 3 (04) 2 (05) 1 (06) 5 (07) 3 (08) 1
(09) 2 (10) 4 (11) ✓ (12) ✓ (13) ✗ (14) ✓ (15) ✗
(16) සටිකාර බ්‍රහ්මයා (17) සහම්පතී බ්‍රහ්මයා (18) ප්‍රාණීන් මැරීමෙන් වැළකීම
(19) බොරු කීමෙන් වැළකීම (20) කීර්තිය පැතිරීම (ල. 20 x 20 = 40)

## II කොටස

01 (i) සතර වරම් දෙවිවරු සාධුකාර පැවැත්වීම / අහසින් සිසිල් හා උණුසුම් දිය දහරා මතුවීම / සත් පියුම් මත වැඩි කුමරු සිංහනාද පැවැත්වීම
(ii) කාලය, දීපය, දේශය. කුලය, මව
(iii) දෙවියන්ට පින් අනුමෝදන් කිරීම සඳහා
(iv) ශික්ෂාකාමී භික්ෂූන් අතර අග තනතුර
(v) මම බොරු කීමෙන් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.
(vi) ආහාරපාන සපයා දී / අවශ්‍යතා ඉටුකර දීම / පරම්පරාව රැකගැනීම / පරපුරෙන් පැවරී ඇති දේපල ආරක්ෂා කිරීම / දෙමාපියන් මියගිය පසු පින්කම් කොට පින් අනුමෝදන් කිරීම
(vii)
1. ජාතික කොඩිය රැගෙන යාමේදී එහි යෂ්ටිය ඍජුව තබාගැනීම.
2. ක්‍රීඩා උත්සවවලදී හෝ වෙනත් අවස්ථාවලදී හෝ හුදු විනෝදය සඳහා ජාතික කොඩිය පරිහරණය නොකිරීම.
3. කිසිඳු අවස්ථාවක එය බිම නොතැබීම.
4. ජාතික කොඩිය ඔසවන අවස්ථාවලදී සියලු දෙනාම නැඟී සිට සීරුවෙන් සිටීම.
5. සිංහ රූපයේ පාද පහළට සිටිනසේ කොඩිය එසවීම.
6. ජාතික කොඩිය එසවූ විගස ජාතික ගීය ගායනය කිරීම.
7. හානියට පත්වූ හෝ අවලක්ෂණ වූ කොඩියක් නොඑසවීම.

(viii) තමා ගැන සිතා අන් අයට අවැඩ පිණිස හේතු වන ක්‍රියාවන්ගෙන් වැළකී, වැඩ පිණිස හේතු වන ක්‍රියාවන්හි නිරත වීම.
(ix)
1. ගහකොළ විනාශ වීමෙන් වැස්ස අඩුවීම.
2. බීමට පිරිසිදු ජලය නැතිව යාම.
3. සතා සිව්පාවා විනාශ වීම.
4. නායයෑම් සිදුවීම
5. මිනිසුන්ට රෝගාබාධ වැළඳීම
6. පස නිසරු වීම

(x) 1. කාලපාසාද පිරිවෙන 2. හත්ථාලක මෙහෙණිවර

02 (i) භග්ගව, ආලාරකාලාම, උද්දකරාමපුත්ත
(ii)
1. පුබ්බේනිවාසානුස්සති ඥාණය (පෙර අත්බව සිහි කරන නුවණ)
2. චුතූපපාත ඥාණය (සත්වයන්ගේ උත්පත්තිය හා මරණය සිදුවන ආකාරය දැකීමේ නුවණ)
3. ආසවක්ඛය ඥාණය (සියලු කෙලෙස් නසන නුවණ)

(iii) තම අරමුණ ජයගැනීමට කැපවීමෙන් ක්‍රියා කිරීම. බාධක බිඳගෙන ඉදිරියට යාම. නොසැලෙන උත්සාහයෙන් හා ධෛර්යයෙන් යුතුව ක්‍රියා කිරීම ආදි වශයෙන් සිසුවා ලියා තිබෙන කරුණු සලකා සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.

03 (i) කය හා වචනය සංවර කර ගැනීම සිලයයි / නොකළ යුත්ත නොකිරීම හා කළයුක්ත කිරීම
(ii) සම්මා වාචා / සම්මා කම්මන්ත / සම්මා ආජීව
(iii) මහත් වූ භෝග සම්පත් ලැබීම / කීර්තිය පැතිරීම / පිරිස් මැද නොබියව කටයුතු කිරීමට හැකිවීම / මරණයට බිය නොමැති වීම / මරණින් මතු සුගතියේ ඉපදීම

04 (i) ඉට්ඨිය මහරහතන් වහන්සේ / උත්තිය මහරහතන් වහන්සේ / සම්බල මහරහතන් වහන්සේ / භද්දසාල මහරහතන් වහන්සේ (ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා)
(ii) ඉස්සර සමණ විහාරය (ඉසුරුමුණිය) / වෙස්සගිරිය / චේතියගිරිය / කාල පාසාද පිරිවෙන හා හත්ථාලක මෙහෙණිවර
(iii)
1. ශ්‍රී ලාංකික භික්ෂු පරපුරක් බිහිවීම.
2. සර්වඥ ධාතු තැන්පත් කොට ස්තූප ඉදිවීම.
3. වෙහෙර විහාර ඉදිවීම.
4. බෞද්ධ පුද පූජා ක්‍රමයක් ඇතිවීම.
5. විදේශීය සාහිත්‍යය පෝෂණය වීම. 6. අධ්‍යාපනය සංවර්ධනයට පත්වීම. (94 පිටුව)

05 (i) කුල සූත්‍රය / අංගුත්තර නිකායේ කුල සූත්‍රය
(ii)
1. විනාශ වූ දේ වෙනුවට අලුත් දේ සපයා ගැනීම.
2. දිරාගියදේ සොයා බලා අලුත් වැඩියා කර ගැනීම.
3. අසීමිතව ආහාර පාන ගැනීමෙන් වැළකීම.
4. චරිතවත් ස්ත්‍රියක හෝ පුරුෂයෙකු ප්‍රධානත්වයට පත් කිරීම.

(iii)
1. ඩෙස් පුටු ආදිය කැඩී බිඳී ගොස් තිබේනම් අලුත්වැඩියා කරවා ගැනීම.
2. ඩෙස් පුටු ආදිය අවුවට හා වැස්සට හසු නොවීමට වග බලා ගැනීම.

ආදී වශයෙන් ශිෂ්‍යයා ලියා තිබෙන කරුණු සලකා ලකුණු ලබාදෙන්න.

06 (i) විනෙය්‍ය මච්ඡේර මාලං - සවේ සද්ධෝති වුච්චති
(ii) සිල්වතුන් දැකීමට කැමති වීම / දහම් ඇසීමට කැමැත්ත තිබීම / මසුරු මල දුරුකොට පරිත්‍යාග කිරීමට කැමති වීම
(iii) අමූලික ශ්‍රද්ධාව - කරුණු විමසා නොබලා අවබෝධයකින් තොරව ඇතිකරගන්නා ශ්‍රද්ධාව
අකාරවතී ශ්‍රද්ධාව - කරුණු විමසා බලා බුද්ධිමත්ව සිතා බලා ඇතිකරගන්නා ශ්‍රද්ධාව